රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

| දුරකතන / தொலைபேசி / Telephone | ෆැක්ස් / தொலைநகல் / Fax | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site |
|---|---|---|---|
| **(94) 011- 2694560** | **(94) 011- 2692254** | **dgcs@pubad.gov.lk** | **www.pubad.gov.lk** |

| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| CS/DOS/Policy/පොදු | | 2023.09.06 |

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ පත්වීම ස්ථිර කිරීම හා එම නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයේ II වන ශ්‍රේණියට උසස් කිරීම සම්බන්ධවයි.</u>**

2013 වර්ෂයේදී සංවර්ධන නිලධාරී සේවයට පත් කරනු ලැබ ඇති නිලධාරීන්, අංක 1774/31 දරණ 2012.09.07 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1745/11 හා 2012 පෙබරවාරි මස 14 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළ කළ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අවම වශයෙන් වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සම්පූර්ණ වන දිනට (අනෙකුත් සුදුසුකම් සපුරා තිබේ නම්) එනම් 2023 වර්ෂය වන විට සංවර්ධන නිලධාරී සේවයේ II වන ශ්‍රේණියට උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබයි.

02. නමුත් වසර 10ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරීන් අතුරින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවීම, නිසි පරිදි ලේඛන ඉදිරිපත් නොවීම ආදී හේතූන් මත සැලකිය යුතු පිරිසක් තවමත් පත්වීම ස්ථිර කර නොමැත. එබැවින් ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ සේවයේ නියුතු 2013 වර්ෂයේදී පත්වීම් ලැබ ඇති සංවර්ධන නිලධාරීන් අතුරින්, පත්වීම ස්ථිර කිරීමට අදාල සියලු සුදුසුකම් සපුරා ඇති නමුත් මෙතෙක් පත්වීම ස්ථිර කර නොමැති නිලධාරීන්ගේ තොරතුරු මේ සමඟ එවනු ලබන ආකෘතියට අනුව සම්පූර්ණ කර එහි මෘදු පිටපත <u>dcs-iv@pubad.gov.lk</u> යන විද්‍යුත් තැපැල් ලිපිනයට 2023.09.30 දිනට පෙර මා වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

03. සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ නිලධාරීන් සම්බන්ධව පත්වීම ස්ථිර කිරීම සඳහා නිර්දේශ යොමු කර ඇති නමුත් මෙතෙක් ස්ථිර කිරීමේ ලිපිය නිකුත් වී නොමැති නම් ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය ලේඛන මගේ අංක CS/DOS/Policy/පොදු/01 හා 2021.09.17 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති පරිදි මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙහි පළකරනු ලබන ලේඛනයේ, එම නිලධාරීන්ගේ නම් ඇතුළත්ව තිබේද යන්න පරීක්ෂා කරන ලෙසත්, එසේ නම් ඇතුළත්ව තිබේ නම් එහි දක්වා ඇති අවශ්‍ය ලිපි ලේඛන කඩිනමින් මා වෙත එවන ලෙසත් කාරුණිකව දන්වමි.

04. තවද, මේ වන විට සංවර්ධන නිලධාරී සේවයේ පත්වීම ස්ථිර කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ඇති නමුත් මෙතෙක් පත්වීම ස්ථිර කිරීමට නිර්දේශ ඉදිරිපත් කර නොමැති නිලධාරීන්ගේ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන ඔබගේ නිර්දේශ සහිතව කඩිනමින් මා වෙත එවන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ නම :

| අනු අංකය | පත්වීම් අංකය | නිලධරයාගේ නම | පත්වීම් දිනය | කාර්යක්ෂමතා කඩයිම් විභාගය සම්පූර්ණ කළ දිනය | පත්වීම ස්ථිර කිරීමට නිර්දේශ ඉදිරිපත් කර තිබේද | | ස්ථිර කිරීමට අවශ්‍යව ඇති ලේඛන වෙබ් අඩවියේ දක්වා ඇත/ නැත | නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසුවද ස්ථිර කිරීමට අවශ්‍යව ඇති ලේඛන එවා ඇත්නම් එම ලේඛන ඉදිරිපත් කළ දිනය | පත්වීම ස්ථිර කිරීමට නිර්දේශ ඉදිරිපත් කර නැත්නම් ඊට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ඇත/ නැත | ඇත්නම් එම දිනය | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

ආයතන ප්‍රධානියාගේ අත්සන :

ආයතන ප්‍රධානියාගේ නිල මුද්‍රාව :